# වික්ටර්, සිසිර සමග සිදංගනා






සම්මානිත මහාචාර්ය
කුසුමා කරුණාරත්න

"පද්‍ය කාව්‍යය, භාවේන්ද්‍රිය හා බුද්ධීන්ද්‍රිය අමතන කලාවක් සේ සැලකේ. ගීතය පළමුව අමතන්නේ ශ්‍රවණේන්ද්‍රියයි. එහෙයින් ගේය කාව්‍ය නොහොත් ගී පද මාලාව ද ප්‍රථමයෙන් ශ්‍රවණේන්ද්‍රිය ඔස්සේ රසික සහෘදයා වෙත ළං වී, ඉක්බිතිව ඔහුගේ භාවේන්ද්‍රියය ද, බුද්ධීන්ද්‍රියය ද අමතන්නේ යයි සැලකීම සුදුසු ය." (රත්න ශ්‍රී විජේසිංහ)

පද්‍ය හා ගීත යන නිර්මාණ ක්ෂේත්‍රද්වය පිළිබඳව ඉතා පැහැදිලි අර්ථ විවරණයක් දෙමින් උක්ත සටහන, 'සිසිරගේ කුරුටු ගී' නම් ගී එකතුවට පෙර-වදනක් ලෙස එක් කර ඇත්තේ ශ්‍රී ලංකාව තුළ ගීත හා පද්‍ය රචනා ක්ෂේත්‍රයෙහි විශිෂ්ටයකු වන රත්න ශ්‍රී විජේසිංහ මහතාය. පද්‍යයේ හා ගීතයේ සම විෂමතා පිළිබඳ විවිධාකාර වාද විවාද පසුගිය කාල පරිච්ඡේදය තු-ළ සිංහල සමාජයේ විද්වතුන්, නිර්මාණ කරුවන් හා විචාරකයන් අතර පළ විය. කෙසේ නමුදු රත්න ශ්‍රී විජේසිංහ මෙම කලා අංග දෙක පිළිබඳ බෙහෙවින් සාධාරණ මෙන්ම පිළිගත හැකි ලෙස ද අදහස් දැක්වීමට යොමු වී ඇත. ඇසින් දකිමින්, කියවා බලා, අප රස විඳගන්නා පද්‍ය කාව්‍ය රචනා පළමුව අපගේ බුද්ධියට හා භාවයන්ට හසු වෙයි. යම් හෙයකින් එය ගායනයෙන් ඉදිරිපත් වුවහොත් තුන් වෙනුව, රසිකයාගේ ශ්‍රවණේන්ද්‍රියට ද යොමු වෙයි. ගීතය සතුව ඇත්තේ මීට වඩා තරමක් වෙනස් ස්වභාවයකි. සාමාන්‍යයෙන් අප ගීතයක් හඳුනාගන්නේ සංගීතය ද මුසු වී, ගායනයෙන් ඉදිරිපත් වන විටදීය. ඒ අනුව රත්න ශ්‍රී විජේසිංහ ද පවසන අයුරින් ගීතයක් මුලින්ම අපගේ සවන්පත්වලට යොමු වෙමින් අනතුරුව බුද්ධියට හා භාවයන්ට සමීප වෙයි. කෙසේ නමුදු මෙම කලා අංග දෙකම සහෘදයා තුළ රස දනවමින් භාවාත්මක හැඟීම් දනවමින් ඒ සමගම ඔවුන්ගේ බුද්ධිය විසින් ස්පර්ශ කරනු ලැබීමට ද ලක් වෙයි. එබැවින් වර්තමාන සමාජය තුළ අඩුවැඩි වශයෙන් මෙම නිර්මාණ අංග දෙක කෙරෙහිම පාඨක, රසික අවධානය යොමු වෙමින් පවතී.

මෙවන් පසුබිමක ලා සලකන විට ප්‍රවීණ සංගීතවේදී ආචාර්ය වික්ටර් රත්නායක නම් වූ ශ්‍රේෂ්ඨ කලාක-රුවා විසින් සංගීතය සම්පාදනය කරනු ලැබ සිය මිහිරි ගායනයෙන් ද සමන්විත වන සේ සහෘදයා වෙත දායාද කරන ලද ගී සමුච්චයක් ලෙස පසුගිය දා හඳුන්වා දෙනු ලැබූ 'සිදංගනා' ගීත එකතුව එම ලක්ෂණවලින් අනූන අපූරු නිර්මාණ එකතු-වක් ලෙස සඳහන් කළ හැකිය. ගීතය වූ කලී වෙනත් ඇතැම් කලා අංග මෙන් තනි පාර්ශ්වයක කුසලතාව පමණක් පිළිබිඹු කරන්නක් නොවේ. විශේෂයෙන්ම සාර්ථක ගීතයක් ඇතුළත විශිෂ්ට පද රචකයෙක්, ප්‍රතිභාපූර්ණ සංගීතඥයෙක් හා දක්ෂ ගායකයෙක් ද වෙති. යහපත්, නිර්මාණශීලී පද පෙළක් සාර්ථක ගීතයක මූලාරම්භය සටහන් කරයි. යහළුවකු ලවා ලියවාගත් වචන ගොන්නකට 'මෙලඩියක්' දමාගෙන සංගීත භාණ්ඩ රාශියක් වාදනය කරමින් නිමවෙන බොහෝ නිර්මාණ නූතන ගායක පරපුර වෙතින් අපට හමු වෙයි. සුභාවිත ගීතය පිළිබඳව එදා මෙදාතුර දක්ෂ සංගීතඥයන්, පද රචකයන්, ගායකයන් ඉතා හොඳ නිදර්ශන ඉදිරිපත් කර ඇතත් ඊට හාත්පසින්ම වෙනස් වන තත්වයක් අද දැකගන්නට ඇති අවස්ථා විරල නොවේ.

සුභාවිත ගීතය සිංහල ගීත සාහිත්‍යයට හඳුන්වා දුන් ගී පද රචකයෝ එදා සිට මේ දක්වාම අපට දැක ගන්නට ලැබෙති. ඒ අතුරෙන් ඇතැමුන් පිළිබඳ බො-හෝ තොරතුරු ප්‍රකට කෙරෙන අවස්ථා ඇතත් ඇතැම් ගී පද රචකයන් සිය කුසලතා පෑන් තුඩින් කුරුටු ගාමින් ගී පද රචනයෙහි නියැළෙමින් නිහඬ සේවාවක යෙදෙන අයුරු ද දැකගත හැකිය.

"මගේ පියා සංගීත ගුරුවරයෙක්. මව සිංහල ගුරු-වරියක්. අපේ ගම අවිස්සාවේල්ල. මා කුඩා කාලයේ මගේ උපන් දිනයකදී දෙමවුපියෝ අපිව, 'කළණ මිතුරෝ' කියන චිත්‍රපටය බලන්න එක්ක ගියා. එතකොට මම පහේ පන්තියේ. මේ චිත්‍රපටයේ ෂෙල්ටන් ප්‍රේමරත්නයි, ගීත නිර්මාණය කරලා තිබුණේ. ගීත පහක්ම ගායනා කළේ වික්ටර් රත්නායක. 'බවයෙන් බවය', 'කළණ මිතුරු දහමයි', 'උපන් කාට වුණත්' වාගේ ඒ ගීත අහලා මම උමතු වුණාය කිව්වොත් නිවැරදියි." (සිළුමිණ - රසඳුන, 2015-02-01)

මෙම ප්‍රකාශය මා උපුටාගත්තේ "සිසිරගේ පද පෙළින්, වික්ටර්ගෙන් සිදංගනා" නමින්, පසුගිය දා සිළුමිණ පුවත්පතේ පළ වූ රසඳුන අතිරේකයෙනි. 'කළණ මිතුරෝ' චිත්‍රපටය ප්‍රදර්ශනය වූ ශාලාවේ එදා එය නැරඹූ ප්‍රේක්ෂක සමූහය කොතරම් සිටින්නට ඇත්දැයි එහෙත් බාල වැඩිහිටි සෙසු ප්‍රේක්ෂකයන් චිත්‍රපටය නරඹමින් එහි තිර රචනය, පසුබිම් දර්ශන ආදියෙන් උද්දාමයට පත් වන්නට ඇති නමුත් සිසිර දිසානායක නම් වූ ලාබාල දරුවා එහි ඇතුළත් ගීතවලින්, ඒවා ගැයුණු ආකාරයෙන්, ගායකයාගේ මනහර ස්වරයෙන් මෙන්ම එම ගීතවල අන්තර්ගත අරුත්වලින් ද ලද සතුට හා ප්‍රීතිය අප්‍රමාණ වන්නට ඇත.

මෙලෙසින් ප්‍රතිභාපූර්ණ, අංකුර පද රචකයකුගේ උපත සිදු වීමට, 'කලණ මිතුරෝ' චිත්‍රපටයත් ගීත ගායනයෙන් එය රසවත් කළ මධුර ස්වරයත් බෙ-හෙවින්ම හේතු වන්නට ඇත. 'හැදෙන ගහ දෙපෙත්තෙන් දැනේ' යන ප්‍රකට කියමන මෙම ළමා චරිතය තුළින් දැකගන්නට ඔහුගේ දෙමාපියන් සමත් වූවාට සැක නැත. වික්ටර් රත්නායක නම් ප්‍රවීණ සංගීතඥයාගේ, ගායකයාගේ 'ස' ප්‍රසංගය ශ්‍රී ලාංකික රසික මනස කුල්මත් කළ අයුරු අපි දුටුවෙමු. එමතු නොව මෙල්බර්න් නගරයේදී පවා ඔහුගේ 'ස' ප්‍රසංගය ශ්‍රී ලාංකික රසික පිරිස වෙත දායාද කෙරුණ බව ද, එවැනි එක් අවස්ථාවකට සහභාගී වූවකු ලෙස මගේ මතකයට නැගෙයි. සිසිර දිසානායක නම් වූ, වර්තමානයේ සිංහල සුභාවිත ගීතයේ රස විඳින හා ඒවායේ අගය හොඳින් දන්නා රසික, සහෘද බොහෝ දෙනාගේ ගෞරවයට පාත්‍ර වී සිටින මෙම ගී පද රචකයා කුඩා වියේ සිට තමන් තුළ වූ විවිධාකාර කලා කුසලතා අතුරින් කිහිපය-ක්ම ඉදිරියට වර්ධනය කරගනිමින් දිගු ගමනක් පැමිණ ඇත. ඒ අතුරෙන් ඔහු අතින් නිර්මාණය වී ඇති ගීතවලින් ප්‍රවීණ සංගීතවේදී ආචාර්ය වික්ටර් රත්නායකගේ සංගීත නිර්මාණයෙන් හා ගායනයෙන් ඔපවත් වූ ගීත දාහතරක් එක් කොට සංගත තැටියක් ලෙස 'සිදංගනා' එළි දැක්වීමට සිසිර දිසානායක පියවර ගෙන ඇත්තේ, ප්‍රවීණ සංගීතවේදී වික්ටර් රත්නායකගේ සංගීත ජීවිතයට අඩ සියවසක් පිරීම නිමිති කොටගෙන වීම විශේෂත්වයකි. 'වික්ටර් . අඩ සියවසක මියැසි පහස' නමින් නම් කොට තිබූ එම විශේෂ අවස්ථාවේදී, ගීත සාහිත්‍යයට සිය මනස යොමු කරමින් තමන් සතු කුසලතා පෝෂණය කරගැනීමට දායක වූ 'සංගීත ලෝකයේ තම වීරයා ලෙසින්' සැලකිය හැකි එතුමාට ගෞරව ප්‍රණාම දැක්වීමක් සිසිර අතින් සිදු වී තිබීම සිංහල සංස්කෘතික සාරධර්ම බෙහෙවින් අගය කිරීමක් ද වෙයි. "වික්ටර් රත්නායක මහත්තයා ගායනා කරපු මුල් ගීත දෙකම ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ විශිෂ්ට ශ්‍රේණියේ සරල ගී වැඩසටහන්වලට ගැයුණ ගීත. ඒ නිසා මම ගුවන්විදුලියෙන් බිහි වුණ ගීත රචකයෙක් වුණා. එදා මෙදාතුර වික්ටර් රත්නායක ගැයූ මගේ පද රචනායි, මේ සංගත තැටියට එකතු වුණේ." යනුවෙන් 'සිළුමිණ' . 'රසඳුන' අතිරේකයට පවසන සිසිර, සිය ගීත නිර්මාණයේදී දේශියත්වය මෙන්ම නිරහංකාර ගුණය ද ප්‍රකට කරන්නා සේම, කළගුණ ඇගයීමේදීත් එම යහගුණ ඔප්පු කර පෙන්වයි.

සුභාවිත ගීතය, පිළිබඳව අද, සිංහල ගීතයේ සැබෑ අගය, නිර්මාණාත්මක ගුණය ගැන අවධානය යොමු කරමින් කථා කරන කවරකු වුවද 'සිදංගනා' ගීත සමුච්චය පිළිබඳව දැඩි ලෙස ප්‍රසාදයට පත් වනු නොඅනුමානයි. බෞද්ධයකු ලෙසින් සිය යහපත් කාර්යය අරඹන සිසිර මෙම ගී පද එකතුවෙහි ආරම්භයට යොදාගෙන ඇති

"සූර්යයා සේ පායා . සත්‍යයේ කිරණ නැංවූ
චන්ද්‍රයා සේ පායා . මිථ්‍යා අඳුර දුර ලූ
භාග්‍යවත් වූ මුනිඳුන්ටයි . මේ බුද්ධාභිවන්දනා ....."
(සිදංගනා)

නම් ගීතය ශ්‍රවණය කරන කවරකුගේ හෝ ශ්‍රවණේන්ද්‍රියට ඉමිහිරි හැඟීම් දනවනසුලුය. හු-දෙක් ගතානුගතික බුදුගුණ ගීයකට යොමු වීමකින් තොරව නව අර්ථකථනයකින් නිර්මාණාත්මක ලෙස බුදුගුණ සිහිපත් කිරීමක් මෙහිදී ගී පද රචකයා අතින් සිදු වී ඇත. හිරු, සඳු යනු බෞද්ධ, අබෞද්ධ කවර පුද්ගලයකුට වුව, ජීවිතය ගෙන යාමට අත්‍යවශ්‍ය ඒවාය. හිරු මෙන් පායා සත්‍යය, ජීවිතය හා ලෝකය පිළිබඳ සත්‍යයේ ආලෝක ධාරාව නැංවීම ගෞතම බුදුරදුන්ගේ මහඟු කාර්යයකි. චන්ද්‍රයා මෙන් පායා ලොව දනන් තුළ පවත්නා මිථ්‍යාව නමැති අන්ධකාය දුර ලූ භාග්‍යවතුන් වහන්සේට මෙලෙසින් බුද්ධාභිවන්දනා පුද කරන සිසිර සිය විශිෂ්ට ගායකයාණන්ගේ ගැඹුරු හා මධුර ස්වරයෙන් එම ගීතය එළිදැක්වීමට ලද අවස්ථාව සැබවින්ම වාසනාවකි.

**දෙමාපියන් . දරුවන් . සොයුරු සො-යුරියන් අතර පවත්නා ආදරය, සෙනෙහස, ළෙන්ගතුකම කලා ලෝකය ද එළිය කරවන සේ ගීතයට නැගීමේ අපූරු දක්ෂතාවක් සහජයෙන්ම මෙන් හිමි කරගෙන ඇති සිසිර දිසානායකගේ මෙම ගී එකතුවට ඇතුළත් තවත් ගී කිහිපය-ක්ම සහෘද මනස තුළ ද සෞන්දර්යය මෙන්ම සෙනෙහෙබර හැඟීම් ද කුළුගන්-වයි.**

ගීත රචකයා මෙම නිර්මාණයේදී භාවිත කර ඇති වචන මාලාව, පද සංයෝජනය හුදෙක් රසික මන-සෙහි ශ්‍රද්ධාව දැනවීමටම සීමා වී නැත. විටෙක සරල පද පෙළක් ද, ඒ අතරට උචිත පරිද්දෙන් ගැඹුරු හඬින් යෙදුණ වචන මාලාව ද තවත් පැත්තකින් ගෙන බලන විට මෙම ගීපදවල ඇති විවිධත්වය ද ප්‍රකට කරවයි. 'සුවහසක් අතින්', 'ප්‍රඥා තිමිර දැල්වූ', 'ගුණ සුවඳ විදා වා තලය පුරා', 'ගඳ දූපයන් දැල්වූ', 'ගම්දනව් පුරා', 'දම් සුවඳ හොවා' වැනි සරල පද එකට ගළපාගනිමින් බුදු බැතිය සමගම අර්ථවත් බව ද ප්‍රකට කරමින් රචිත මෙම පද පෙළ සැබවින්ම බොදු මනස තුළ බුදු බැතිය අපමණ ලෙස නංවා ලන්නකි.

නිර්මාණකරණයේදී ගීත රචකයකු- හෝ අන් කවර කලා කරුවකු වුවද සිය ජීවන අත්දැකීම් යම් පමණකට හෝ තම නිර්මාණවලට පාදක කොට ගනියි. එමෙන්ම සමාජය තුළ 'පවුල' නමැති අගනා සමාජ ඒකකය රැකෙන පරිදි තම සිතුවිලි මෙන්ම ක්‍රියාකලාපය ද යොමු කරන සංවේදී නිර්මා-ණකරුවකුගේ පෑන් තුඩින් ගැළපුණ රසවත් පද පෙළක් 'සිදංගනා' ගීත එකතුවෙහි දෙවැන්න ලෙසට එක් කොටගෙන ඇත. දෙමාපියන්ට තම දරුවා, තමන් සතු වටිනාම වස්තුව බව බුද්ධ දේශනාවෙහි ද ප්‍රකට වූ අදහසයි. කෙනකු සතු වටිනාම වස්තුව කුමක්දැයි ඇසුණ පැනයකට බුදුන් වහන්සේගේ පිළිතුර වූයේ, "පුත්තා වත්ථු මනුස-"සානං" යන්නය. දරුවන් මෙලොවට බිහි කොට හදා වඩා ගන්නා මනුෂ්‍යයන්ට ඔවුන් සතු අගනාම වස්තුව දරුවෝය. සිය බිළිඳු පුතා ඇකයෙහි හොවාගන්නට පෙර, ඔහුගේ මුව සිප ගන්නට පෙර නියපෙළ සිඳ ලා, දැලිපත සිඳ ලා, දරුවාගේ සියුමැලි සිරුරට මඳ හෝ අපහසුවක් නොදැනෙන්නට සිය පුතු ආදරයෙන් තුරුළට ගන්නා ආකාරය සිය අත්දැකීම් සමග ගළපාගෙන ඉමිහිරි ගී පද වැළකට ගොනු කරගන්නා සිසිර දිසානායක මෙම ගීත සමුච්චයේ දෙවැන්න ලෙස යොදාගත්,

"නිය පෙළ සිඳලයි දෑත පාන්නේ . තුරුළට ගන්නට
ආදරයෙන්
දැලිපත සිඳලයි කොපුල පාන්නේ . මුව සිප ගන්නට
ආදරයෙන් ....." (සිදංගනා)

නම් වූ ගීය පියකුගේ දාරක ස්නේහය අපමණ ලෙස කියා පාන, සුන්දර, සුමධුර ගීතයකි. ආචාර්ය වික්ටර් රත්නායකගේ තනුව හා සංගීතයට එක් වන මිහිරි ගායනය ද සිසිරගේ පද වැළ වඩාත් ආලෝකවත් කර ඇති බවට සැක නැත.

දෙමාපිය . දරු සෙනෙහස මෙන්ම සහෝදර ප්‍රේමය ද හොඳින් හඳුනනු, ගැමි සංස්කෘතියේ සුන්දර හැදියා-වකින් පිරිපුන් සිසිර දිසානායක අර්ථවත් ගී පද රච-නයෙහි දක්වා ඇති දක්ෂතාව 'සිදංගනා' හි ඇතුළත් සියලු ගීවලින් ප්‍රකට වන බව අමුතුවෙන් කිව යුතු නොවේ. ආදරණීය දෙමාපිය යුවළකගේ සෙනෙහස හා රැකවරණය මෙන්ම සහෝදර පිරිස අතර ඇති ළෙන්ගතුකම ද බාල වියේ සිටම කෙනකුගේ ජීවිතය අර්ථවත් මෙන්ම පරිපූර්ණ කිරීමට ද හේතු වෙයි. 'සිදංගනා' හි ඊළඟ ගීතය ලෙස එක් කර ඇති "බිතක්කනේ හැංගෙනවා . අම්මගෙ හේමලයා . මගෙ බාල ටිකිරි මලයා ...." යන ගීතය ද අරුත්බර බවෙන් මෙන්ම ගැමි වහරෙන් ද සමන්විත වන සේ රචිත නිර්මාණයකි.

සිය බාල සොහොයුරා තම මවගේ සෙවණැල්ල මෙන් සුරතල් වෙමින් හැදෙනු වැඩෙනු දකින වැඩිමල් සො-හොයුරා තුළ ද ඇතිවන ආදරය පළමු දෙපදයෙන් කියවෙන අතර ඊට ප්‍රතිචාර ලෙස වැඩිමල් සොහො-යුරාට තම ආදරය හා ගෞරවය දක්වන බාල සො-යුරාගේ වදන් ලෙස මෙසේ පද ගළපාගෙන ඇත.

"කුරක්කනේ වෙහෙසෙනවා . අප්පච්චිගෙ දෙයියා
අපෙ සවිය නුඹයි අයියා ..." (සිදංගනා)

සාමාන්‍යයෙන් ගැමි පවුලක් තුළ වැඩිමල් පුත්‍රයා පියාගේ කටයුතුවලට දක්වන සහාය මෙන්ම පවුලට ද ඔහු ශක්තියක් වන අයුරු බාල සොහොයුරාගේ වදන් වැළ ලෙස ගළපාගෙන ඇති ආකා රය අපූරුය. වික්ටර් රත්නායක ගායකයාණන් සමග මෙම ගීය ගැයුමට එක් වන ප්‍රවීණ ගායක සුනිල් එදිරිසිංහගේ ස්වරය මෙම ගීතයෙහි ගැමි සංස්කෘතික පසුබිමේ හා පවුල් පසුබිමේ ප්‍රබල බව තව තවත් ඔපවත් කරන